# ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

**ඍජු ආධාර වැඩසටහන**

ඍජු ආධාර වැඩසටහන යනු නම්‍යශීලී සුළු පරිමාණ ආධාර වැඩසටහනක් වන අතර එය අඩු වරප්‍රසාද සහිත ජන කොටස්වලට වහා සහන සැලසීමට හැකි වන අයුරින් ලාබ නොලබන අරමුණින් ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් සඳහා හිමි වන්නකි. සංවර්ධන ඉලක්ක ඉහළ නැංවීම සහ උපකාර වැඩි වශයෙන් ම අවශ්‍ය කෙරෙන පුද්ගලයන්ගේ මානුෂවාදී දුෂ්කරතා අවම කිරීම ඍජු ආධාර වැඩසටහනින් ක්‍රියාත්මක කෙරේ.

**ඉලක්ක කෙරෙන ක්ෂේත්‍ර**

සංවර්ධනය ඉලක්ක කර ගත් ගුණාත්මක බවින් ඉහළ අයදුම්පත්‍ර අප පිළිගන්නා අතර ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ජීවත් වන ජනකණ්ඩායම්වල ජීවන තත්ත්වයන් වැඩි වර්ධනය කිරීමට ඉන් අපේක්ෂා කෙරේ.

පහත දැක්වෙන අංශ කෙරෙහි අරමුණු කෙරුණු ආධාර ව්‍යාපෘති සඳහා ඍජු ආධාර වැඩසටහන විවෘත වේ.

- සුළු පරිමාණ ආදායම් උත්පාදනය
- ප්‍රජා සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව
- අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව
- සුළු පරිමාණ යටිතල පහසුකම්
- ග්‍රාමීය සංවර්ධනය
- කාන්තා සවිබල ගැන්වීම
- මානව හිමිකම් පිළිබඳ පුහුණු වැඩසටහන්/ අධ්‍යාපනය සහ යහපාලනය
- පශ්චාත් යුද සංවර්ධන කටයුතු

කාන්තා, ළමා, ආබාධිත පුරවැසියන්, වැඩිහිටි ජනතාව සහ වෙනත් දුෂ්කරතාවලට මුහුණ දී සිටින සමාජ කණ්ඩායම්වල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

ඇතැම් අවස්ථාවල දී, සංවර්ධනය සමග ඍජු සම්බන්ධතාවක් ඇති සංස්කෘතිය ආරක්ෂා කිරීමේ ව්‍යාපෘති සහ ක්‍රීඩාවට අදාළ ව්‍යාපෘති ද මෙම ඍජු ආධාර වැඩසටහන යටතේ අරමුදල් සැපයීම කෙරෙහි සලකා බලනු ලැබේ.

**මාර්ගෝපදේශ**

ඍජු ආධාර වැඩසටහන යටතේ අරමුදල් සම්පාදනය කිරීම සඳහා අයදුම්පත් සලකා බැලීමේ දී මාර්ගෝපදේශ ගණනාවක් සලකා බැලේ. ඒවා පහත පරිදි වේ:

- ඍජු ආධාර වැඩසටහනේ අරමුදල් ලබන වැඩසටහන් තුළින් ඉහළ සංවර්ධන ප්‍රතිලාභ හිමි විය යුතුය. ආධාර වැඩසටහන යටතේ ලබා ගැනීමට අපේක්ෂා කෙරෙන සංවර්ධන අභිමතාර්ථ අයදුම්පත්‍රයේ පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.
- සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය යන ක්‍රියාවලී සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය ලබා ගැනීම.
- මෙම වැඩසටහන යටතේ ආධාර  ලබන්නන් විසින් මුදල් යෙදවීම සහ/හෝ වෙනත් එවැනි ක්‍රමයක් මඟින් අදාළ ව්‍යාපෘතියට දායක වීම සැලකිය යුතු ලෙස සිදු කළ යුතුය. ව්‍යාපෘති යෝජනාව තුළ තමන් ලබා දෙන දායකත්වයේ මට්ටම සහ ස්වරූපය දැක්විය යුතුය.
- තමන්ට සිය කාර්යයන් ඉටු කර ගැනීමට හැකි වන තත්ත්වයට පත් කිරීමට සහ වඩාත් තිරසාර තත්ත්වයක් ඇති කිරීමට හැකි වන පරිද්දෙන් ව්‍යාපෘති සකස් විය යුතුය.
- ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය පාලන අධිකාරියේ අනුමැතිය පළ වී තිබිය යුතුය.
- සුදුසු ආයතනික සහයෝගීතාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන විධිවිධාන මෙහිදී විස්තර කළ යුතුය. නිදසුනක් ලෙස පුනරාවර්තන වියදම් නිර්මාණය වීමේ මට්ටම සහ දීර්ඝ කාලීන වශයෙන් මෙවැනි පිරිවැය දරා ගැනීමේ හැකියාව විදහා දැක්වීම සඳහා ඇති සාක්ෂි.
- අරමුදල ලබා දීම අවසන් වීමෙන් පසුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ පවත්වා ගෙන යැමට ප්‍රාදේශීය බලධාරීන්ගේ සහ/හෝ ප්‍රතිලාභීන්ගේ කැපවීම සහ උනන්දුව අයදුම්පත් තුළින් පෙන්නුම් කළ යුතු වේ.
- මැනිය හැකි කාර්ය සාධක දර්ශක සහ නිරීක්ෂණ යන්ත්‍රණ යෝජනාවලිය තුළින් පෙන්නුම් කළ යුතු වේ.
- ගොඩනැගිලි සහ ඉදිකිරීම්වලට අදාළ ව්‍යාපෘති ඔස්ට්‍රේලියානු ප්‍රමිතීන්වලට අනුකූල විය යුතුය. ගොඩනැගිලි හෝ ඉදිකිරීම් අමුද්‍රව්‍යයක් වශයෙන් ඇස්බැස්ටොස් භාවිත නොකළ යුතුය.
- මෙම ව්‍යාපෘතිවලට දරුවන් සම්බන්ධ වන්නේ නම් ළමා ආරක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අදාළ සංවිධානය වග බලා ගත යුතුය.

**යෝග්‍යතාව**

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ නෛතික වශයෙන් ලියාපදිංචි වී සිටින ලාබ නොලබන පදනම යටතේ සංවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින ප්‍රජා කණ්ඩායම් සහ රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපන ආයතන සහ පළාත් පාලන ආයතන සඳහා මෙම ඍජු ආධාර වැඩසටහන යටතේ අරමුදල් හිමි වේ.

එක් ආධාර වටයක් සඳහා කිසියම් සංවිධානයකට එක් ව්‍යාපෘති යෝජනාවකට වඩා වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකිය.

ඍජු ආධාර වැඩසටහන යටතේ පහත දැක්වෙන ක්ෂේත්‍ර සඳහා අරමුදල් සපයනු නොලැබේ.

- ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ පැවැත්වෙන සම්මන්ත්‍රණ සහ විදේශ අධ්‍යාපන චාරිකා
- ඔස්ට්‍රේලියාවේ අධ්‍යයන පුහුණුව
- කාර්ය මණ්ඩල වැටුප්, කාර්යාල කුලී සහ උපයෝගීතා පිරිවැය වැනි පුනරාවර්තන වියදම් සඳහා
- අමතර කොටස්, සැපයුම්, නඩත්තු සහ අලුත්වැඩියා.
- ව්‍යාපෘතියේ පිරිවැයෙන් විශාල මුදලක් විශේෂඥයන් සහ උපදේශකයන් වෙනුවෙන් වෙන් කෙරුණු අවස්ථාවල.
- ක්ෂුද්‍ර ණය වැඩසටහන්
- ව්‍යාපෘතියේ පරිපාලන පිරිවැය ව්‍යාපෘතියේ සමස්ත වටිනාකමින් සියයට 10කට වඩා අඩු විය යුතුය. රාජ්‍ය නොවන සංවිධානවල වැටුප්, කුලී හෝ වෙනත් එවැනි වියදම් ඍජු ආධාර වැඩසටහන යටතේ ආවරණය නොකෙරේ. ව්‍යාපෘතියට අදාළ පිරිවැය සඳහා පමණක් අරමුදල් වෙන් කෙරේ.

**අරමුදල**

ඍජු ආධාර වැඩසටහන යටතේ ආවරණය කෙරෙන ව්‍යාපෘතිවල වටිනාකම සාමාන්‍යයෙන් රුපියල් 3,000,000 ක් වේ. ඉහළ වියදමක් දැරීමට සිදු වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සංවිධාන ඒ සඳහා උපදෙස් ලබා ගැනීමට ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධ විය යුතුය. (දුරකථන අංක පහත දැක්වේ.)

**කාලසීමාව**

ඍජු ආධාර වැඩසටහනේ අරමුදල් ලබා දෙන වැඩසටහනක් වසරක කාලයක් සඳහා වලංගු වේ. ව්‍යාපෘතියේ ස්වාභාවය අනුව ඇතැම් ව්‍යාපෘති වසර දෙකක කාලයක් දක්වා දීර්ඝ කිරීමට සලකා බැලීමට පුළුවන. දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා යොමු වීමට අදහස් කරන සංවිධාන සිය අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ උපදෙස් පැතීම වඩාත් සුදුසුය.

**වගවීම, පාරදෘශ්‍යතාව සහ වාර්තා කිරීම**

ඍජු ආධාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සෑම ව්‍යාපෘතියක් තුළින් ම ඉතා ඉහළ මට්ටමේ පාරදෘශ්‍යතාවක් සහ වගවීමක් ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය අපේක්ෂා කරයි. ඉලක්කගත ප්‍රජාවන්ට උපරිම ප්‍රතිලාභ හිමි කර නොදෙන අපතේ යෑමේ අවදානම් , පරිපාලන පිරිවැය සහ වෙනත් පිරිවැය යෝජනාවලිය මඟින් අවම කර ඇති බව පෙන්නුම් කළ යුතුය.

ඍජු ආධාර වැඩසටහන යටතේ අරමුදල් ලබන සංවිධාන විසින් පහත දැක්වෙන කරුණු සම්පූර්ණ කළ යුතුය.

- අරමුදලේ වගන්ති සහ කොන්දේසිවලට එකඟ වීම සහතික කරමින් ගිවිසුමකට අත්සන් තැබීම.
- ඔබගේ අයදුම්පතේ විද්‍යුත් පිටපත් සැපයිය යුතුය.
- සෑම වියදමකටම අදාළ ව පූර්ණ මූල්‍ය වාර්තා පවත්වා ගැනීම ( රිසිට් පත් ද ඇතුළුව )

- මුල්‍ය ආධාර ලැබී මාස හයක් ඇතුලත ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි
- ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසුව රිසිට්පත් ද ඇතුළත් ව සම්පූර්ණ මූල්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම.

**අයැදුම්පත් ක්‍රියාවලිය**

අරමුදලක් සඳහා ඉල්ලීමක් කිරීමට අදාළ සංවිධාන මඟින් ඍජු ආධාර වැඩසටහනේ අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. ( ) ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් අයදුම්පත්‍රය ලබා ගත හැකිය.

ඕනෑම අවස්ථාවක දී අයදුම්පත් ඉදිරිපත් කිරීමට පුළුවන. අරමුදල් ලබාදීම සලකා බැලීම සඳහා සෑම වසරක දී ම මාර්තු සහ නොවැම්බර් පැවැත්වෙන වට දෙකේ දී එම අයදුම්පත් සලකා බලනු ලැබේ.

අයදුම්පත් මඟින් පහත දෑ ප්‍රකාශ විය යුතුය.

- ව්‍යාපෘතියේ අරමුණු පැහැදිලි ලෙස විස්තර කිරීම සහ ප්‍රතිලාභ ලබන පුද්ගලයන් පිළිබඳ විස්තරය
- ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තරය
- මීට සමාන ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම මඟින් ඔබගේ සංවිධානය ප්‍රායෝගිකව ලබා ඇති අත්දැකීම් පිළිබඳ විස්තර කිරීම.
- සැබෑ සහ සාධාරණ පිරිවැය යොදමින් එක් එක් අයිතමයන් පිළිබඳ සටහන් කරමින් සකස් කෙරුණු අයවැයක් ඉදිරිපත් කිරීම.
- තොරතුරු විමසීට සම්බන්ධ කර ගැනීමට හැකි අය ගේ තොරතුරු ( ඊමේල් ලිපිනයන් ද ඇතුළත්ව) සහ ඔබගේ සංවිධානය සම්බන්ධයෙන් ධනාත්මකව සහ දැනුමකින් යුක්තව කරුණු දැක්විය හැකි මින් පෙර සම්බන්ධ වූ පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගත හැකි තොරතුරු.
- ආධාර ලැබෙන මූලාශ්‍රය පිළිබඳ ඔබ සඳහන් කරන්නේ කෙසේද යන්න විස්තර කරන්න. ( ඔස්ට්‍රේලියානු රජය විසින් ආධාර කරන ලද වැඩසටහනක් යන්න ලාංඡන ආකාරයෙන් ඔබගේ වැඩසටහන තුළ දැක්වීම සඳහා ආධාර මුදලින් සුළු මුදලක් වෙන් කර ගැනීමේ අවස්ථාව ඇත. උදා. පොත් පරිත්‍යාග කිරීම්වල දී විස්තර සඳහන් සීල් ගැසීම හෝ මාධ්‍ය ප්‍රචාරයක් ලබාදීමට හැකියි.)

**අයදුම්පත් එවිය යුතු ආකාරය**

අයදුම්පත් පහත දැක්වන ආකාරවලින් ඊමේල් ආකාරයෙන් හෝ දෘඩ පිටපත් ලෙස එවිය යුතුයඃ

ශ්‍රී ලංකාවේ බස්නාහිර, සබරගමුව, දකුණු සහ ඌව පළාත්වලින් ඉදිරිපත් කෙරෙන ඍජු ආධාර වැඩසටහන් ව්‍යෘපෘති වාර්තා එවිය යුත්තේඃ

**නාමල් පෙරේරා මහතා**
ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය
21, ශ්‍රීමත් ආර්.ජී. සේනානායක මාවත
කොළඹ 07.
දු: + 94 11 2463242
ෆැ: + 94 11 2686939
ඊමේල් :namal.perera@dfat.gov.au

මාලදිවයිනෙන් සහ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වලින් යොමු කෙරෙන ඍජු ආධාර වැඩසටහන් ව්‍යාපෘති වාර්තා එවිය යුත්තේ:

**නස්රීන් මරික්කාර් මෙනවිය**
ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය
21, ශ්‍රීමත් ආර්.ජී. සේනානායක මාවත
කොළඹ 07.
දු: + 94 11 2463243
ෆැ: + 94 11 2686939
ඊමේල් :nazreen.marikkar@dfat.gov.au

ශ්‍රී ලංකාවේ මධ්‍යම, වයඹ සහ උතුරු මැද පළාත්වලින් යොමු කෙරෙන ඍජු ආධාර වැඩසටහන් ව්‍යාපෘති වාර්තා එවිය යුත්තේ:

**සොනාලි කරුණාරත්න මහත්මිය**
ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය
21, ශ්‍රීමත් ආර්.ජී. සේනානායක මාවත
කොළඹ 07.
දු: + 94 11 2463301
ෆැ: + 94 11 2686939
ඊමේල් : sonali.karunaratne@dfat.gov.au

ඉතා ඉහළ ගුණාත්මක බවකින් යුතු අයදුම්පත් විශාල සංඛ්‍යාවක් අප වෙත ලැබෙන අතර ඒවාගේ ඇති ගුණාත්මකභාවය පිරික්සා වර්ග කිරීම සඳහා අප හට කාලයක් අවශ්‍ය වේ.

ව්‍යාපෘති යෝජනා තෝරා ගනු ලැබූ සංවිධාන වෙත පමණක් දැනුම් දීම් සිදු කෙරෙනු ඇත. 2014-2015 අයදුම්පත් බාර ගැනීමේ අවසන් දිනයේ සිට මාස 08 ක කාලයක් තුළ ඔබට අපගෙන් ඇමතුමක්/පණිවුඩයක් නොලැබුණේ නම් ඔබගේ අයදුම්පත අසමත් වී ඇති බව කරුණාවෙන් සලකන්න.